<u>රත්නපුර මහා නගර සභාව</u>

<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන.
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 03 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 10 දින සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ලැබිය යුතු දේපල ණය පොලී ආදායම හා වැටුප් ප්‍රතිපූර්ණය පිළිවෙලින් රු. 98,504 ක් හා රු. 11,601,634 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබූ අතර, පසුගිය වසරේ දෙසැම්බර් මාසය සඳහා සමාලෝචිත වර්ෂයේදී ලද එම ආදායම පිළිවෙලින් රු. 86,838 ක් හා රු. 1,814,628 ක්ද, මෙම වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව සමාලෝචිත වර්ෂයේදී ලද රු. 116,000 ක්වූ සභික දීමනා ප්‍රතිපූර්ණ ආදායම, සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී කුඩුගල්වත්ත කඩකුලී හා සාප්පු සංකීර්ණ කුලී බිල්කල ආදායම රු. 534,235 ක් වුවත්, එය රු. 562,410 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අයශීර්ෂ 02 කට අදාල බිල්කල ආදායම වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර නොතිබූ බැවින් වර්ෂයේ ආදායම රු. 454,541 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සැලසුම් කම්ටු ගිණුමේ ආදායම් ගිණුම්ගත කිරීමේදී අනවසර සේවා ගාස්තු ආදායම් ලැබීම් රු. 100,000 ක් පෙරසැරි ගාස්තු ආදායම් ලැබීම් ලෙස අයශීර්ෂ මාරුකර ගිණුම්ගත කර තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ලද මුද්දර ගාස්තු ආදායම වූ රු. 13,537,102 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුවට අදාලව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කලයුතු එකතු කල අගය මත බදු මුදල රු. 1,684,492 ක් වුවද, වගකීම් ලෙස රු. 2,641,252 ක් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව ප්‍රේෂණය කල යුතු ජාතිය ගොඩනැඟීමේ බදු මුදල් රු. 116,980 ක් වුවද, වගකීම් ලෙස රු.301,843 ක් ගිණුම්ගත කර තිබුණි.

(එ) සභාව සතු ඉඩම් බදු දීමට අදාලව 2015 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී ලැබූ කලින් ලද ආදායම් වටිනාකම වූ රු. 55,103 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුලදී සභාව සඳහා මිලදී ගත් යතුරුපැදි 03 ක වටිනාකම වූ රු. 445,559 ක් සේවක ණයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මීට අමතරව මෙම සේවක ණය බැංකු ගිණුමෙන් සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් වියදම් සඳහා පොදු ගිණුමට මාරු කරන ලද රු. 1,530,951 ක්, සේවක ණය ගෙවීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඔ) ආදායම් අයශීර්ෂ 06 කට අදාලව 2015 වර්ෂයට අදාල ලැබීම් රු. 122,170 ක් හිඟහිටි වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය තුලදී ගබඩා අත්තිකාරම් යටතේ සිදු කරන ලද වියදම රු. 32,136,267 ක් වුවද, රු. 32,534,733 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් අතැති තොග වටිනාකම රු. 398,466 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) ප්‍රධාන ලෙජරයේ අතැති මුදල් ගිණුමේ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු. 1,006,303 ක් ලෙස දක්වා තිබූ අතර, එයින් රු. 944,264 ක් අතැති මුදල් ශේෂය පොදු ගිණුමට මාරු කිරීම වශයෙන් ජ'නල් සටහන් මඟින් එම ගිණුමට බැර කර තිබුණි. මෙවැනි ජ'නල් සටහන් යෙදීමේ අවශ්‍යතාවය කුමක්දැයි පිළිගතහැකි කිසිඳු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ග). 2014 දෙසැම්බර් 31 දිනට අතැති මුදල් රු. 123,234 ක් ලෙස සනාථ කලද, සමාලෝචිත වර්ෂය අවසානයේ අතැති මුදල් ගිණුමේ ශේෂය ලෙස රු. 717,947 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි. රු. 594,713 ක්වූ මෙම වෙනස පිළිබඳ කිසිඳු පැහැදිලි කිරීමක් කර නොතිබුණි.

(ච) සමාලෝචිත වර්ෂය තුලදී ගබඩා අත්තිකාරම් යටතේ මිලදී ගත් රු. 1,677,484 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල සඳහා පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු. 27,965 ක් වටිනාකමැති පුස්තකාල පොත් වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ට) සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ගිණුම් වලට අදාලව මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ශේෂයන් මුදල් පොතේ ඇතුලත්ව ඇති ශේෂයන් සමඟ සැසඳීමේදී පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| ගිණුම් අංකය | නම | මුදල් පොත අනුව ශේෂය | ගිණුම් ප්‍රකාශ අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 1015721 | පොදු ගිණුම | 831,035 | 1,214,194 | 383,159 |
| 2161282 | සංවර්ධන ගිණුම | 524,309 | 686,263 | 161,954 |
| 8153561 | සැලසුම් ගිණුම | 1,415,168 | 1,418,865 | 3,697 |
| 73524973 | සේවක ණය ගිණුම | 1,773,108 | 1,744,725 | 28,383 |

(ඩ) සමාලෝචිත වර්ෂයට අදාලව රු. 2,411,309 ක් වටිනාකමැති ගෙවිය යුතු වියදම් සඳහා ණයහිමියන් යටතේ වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ණ) සමාලෝචිත වර්ෂය තුලදී බැංකු ගිණුම් 05 කින් පොදු ගිණුමට රු. 19,630,951 ක් අභ්‍යන්තර ණය ගිණුම මඟින් මාරු කර තිබූ නමුත්, අභ්‍යන්තර ණය ගිණුම මඟින් සටහන් කර තිබුණේ රු. 12,600,000 ක් පමණි. තවද, සෑම සටහනක්ම අභ්‍යන්තර ණය ගිණුම මඟින් පොදු ගිණුමට සටහන් කර තිබූ බැවින් අභ්‍යන්තර ණය ගිණුමේ ශේෂයක් පැවතිය නොහැකි වන නමුත් සමාලෝචිත වර්ෂය අවසානයේදී එම ගිණුමේ රු. 32,103,872 ක ශේෂයක් දක්වා තිබුණි.

(ත) සමාලෝචිත වර්ෂයේ සේවක ණය පොලී ලැබීම් රු. 739,765 ක් අදාල අය ශීර්ෂය යටතේ ගිණුම්ගත කරනු වෙනුවට සේවක ණය වාරික ලැබීම් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(ද) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර අංක 2201 යටතේ රත්නපුර ප්‍රවේශ මාර්ගය සහ බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබාගත් රු. මිලියන 42 ක්වූ ණය මුදලට අදාලව සමාලෝචිත වර්ෂයේදී ණය වාරික රු. 2,939,856 ක් හා ණය පොලී රු. 3,535,138 ක් ලෙස රු. 6,474,994 ක් ගෙවා තිබුණි. නමුත් අදාල වැය විෂයය මඟින් ගෙවූ ණය වාරික හා පොලී ලෙස ගිණුම්ගත කර තිබුණේ පිළිවෙලින් රු. 2,229,237 ක් හා රු. 1,667,803 ක් ලෙස රු. 3,897,040 ක් පමණක් බැවින් ඉතිරි ශේෂය වූ රු. 2,577,954 ක් ගිණුම්ගත වූ ආකාරය පිළිබඳ පිළිගත හැකි කිසිඳු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරිණ.

(න) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර අංක 1632 යටතේ රත්නපුර වෙරළප පාර සංවර්ධනය කිරීමේ ණය මුදල වූ රු. 12,656,450 ට අදාලව ඉදිරිපත් කර ඇති ණය සනාථන ප්‍රකාශය අනුව 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 3,920,888 ක්වූ පොලී මුදල උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ප) ආදායම් එකතු කිරීමේ විශේෂ ඉතිරි කිරීමේ ගිණුමෙන් සමාලෝචිත වර්ෂය තුලදී පොදු පරිපාලන ගිණුමට මාරු කර තිබූ රු. 8,000,000 ක් එම ගිණුමේ සටහන් කර නොතිබුණි.

(බ) සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කර තිබූ එකතුව රු. 33,387 ක්වූ ජාතිය ගොඩනැගීමේ බදු සභාව විසින් අයකර ගෙන තිබූ එම බදු වටිනාකමින් අඩුකර ගිණුම්ගත කර තිබුණි.

(ම) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී රු. 11,250 ක් වටිනාකමැති ද්‍රව්‍ය සෞඛ්‍ය අංශය වෙත නිකුත් කර තිබූ නමුත් එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු වල ඇතුලත්ව නොමැති වැය විෂයයන් 02 කට ගිණුම්ගත කර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

(අ) ගිණුම් විෂයයන් 11 කට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව දැක්වෙන ශේෂයන් සහ උපයෝගී ලේඛණ අනුව දැක්වෙන ශේෂයන් අතර රු. 6,791,488 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) වැය ලේඛණය හා මූල්‍ය ප්‍රකාශනය සැසඳීමේදී වැය විෂයයන් 07 කට අදාලව රු. 898,919 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආසියානු සංවර්ධන බැංකු ණය ප්‍රාග්ධනය රු. 54,566,853 ක්, නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘති ණය ගිණුම රු. 1,559,433 ක් වශයෙන් ණය ප්‍රාග්ධනය ලෙස රු. 56,126,286 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇතත්, එම ණය ශේෂයන් පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) දීර්ඝ කාලයක සිට පැවත එන එකතුව රු. 6,511,802 ක් වටිනාකමැති තැන්පතු පිළිබඳ විස්තර ඇතුලත් උපලේඛණයක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) වියදම් ණයහිමි ගිණුමේ ආරම්භක ශේෂය වූ රු. 67,368,392 ක මුදල තහවුරු කර ගැනීම සඳහා පසුගිය වසරේ ණයහිමි ලේඛණය විගණනයට ඉදිරිපත් නොවුණි.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අයහාරය ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 21,719,263 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අයහාරය ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 579,358 ක් විය.

(ආ) සභාව විසින් ඉකුත් වර්ෂ වල ගිණුම්ගත කර නොතිබූ ආදායම් වියදම් ගිණුම් විෂයයන් හා ගිණුම් වලට කරන ලද විවිධ ගැලපීම් සමුච්චිත අරමුදල් ගිණුම මගින් වාර්ෂිකව ගැලපීම් සිදු කිරීම නිත්‍ය ලක්ෂණයක් වී තිබුණි. මේ නිසා එකී වර්ෂ වල මූල්‍ය ප්‍රතිඵලය කෙරෙහි විශ්වාසය තැබිය නොහැකි වූ අතර, සමාලෝචිත වර්ෂයේ ප්‍රතිඵලය සම්බන්ධයෙන්ද මෙවැනි ගැලපීම් ඉදිරි වර්ෂ වලදී සිදුකල හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

| වර්ෂය | මූල්‍ය ප්‍රතිඵලය | සමුච්චිත අරමුදලට ගැලපීම | | ගැලපීමෙන් පසු මූල්‍ය ප්‍රතිඵලය |
|---|---|---|---|---|
| | රු. | රු. | | රු. |
| | | හර | බැර | |
| 2013 | (33,715,528) | 14,585,117 | 5,729,096 | (42,571,549) |
| 2012 | 16,251,538 | 2,343,200 | 10,742 | 13,919,080 |
| 2011 | (4,089,542) | 1,817,490 | 1,907,722 | (20,361,310) |

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ඌනතාවය රු. 21,139,905 කින් වැඩිවී තිබූ අතර, එය සියයට 3649 ක වැඩිවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු, වරෙන්තු ගාස්තු දඩ, වෙනත් ආදායම් වල පිළිවෙලින් සියයට 09, සියයට 01, සියයට 03 හා සියයට 14 ක අඩුවීම හා වැටුප් හා දීමනා, ගමන් වියදම්, සැපයුම් හා උපකරණ, ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව, ප්‍රවාහන සම්බන්ධතා හා විශ්‍රාම වැටුප් වල පිළිවෙලින් සියයට 21, සියයට 03, සියයට 14, සියයට 07, සියයට 10 හා සියයට 88 ක වැඩිවීම විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 31,100 | 32,467 | 22,027 |
| බදු කුලී | 66,413 | 42,889 | 17,325 |
| බලපත්‍ර ගාස්තු | 2,443 | 1,908 | - |
| වෙනත් ආදායම් | 76,441 | 50,192 | 1,019 |

### 2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් හා රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බදු කුලී ආදායම, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, වරෙන්තු ගාස්තු හා දඩ සහ වෙනත් ආදායම් වල ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල අදායමෙහි පිළිවෙලින් සියයට 35, සියයට 22, සියයට 12, සියයට 90 හා සියයට 31 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

### 2.3.3 බදු කුලී

(අ) නගර සභාවට අයත් මහජන පොල කඩකාමර 126 කින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 3,713,816 ක් අයවිය යුතුව තිබූ අතර, ඉන් කඩකාමර 99 කින් රු. 50,000 ට වඩා වැඩියෙන් හිඟහිටවා තිබූ කඩකාමර සංඛ්‍යාව 23 ක්වූ අතර, එහි වටිනාකම රු. 1,615,837 ක් පමණ බව නිරීක්ෂණය විය.

(ආ) සභාව සතු ලක්ෂ්මී සිනමා ශාලාව සඳහා 2006 මැයි මස සිට 2014 දෙසැම්බර් 31 දක්වා ලැබිය යුතු බදු කුලී ආදායම වූ රු. 551,000 ක් අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදීද කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

2.3.4 වෙනත් ආදායම්

---------------------

ලංගම බස් රථ ගාල් කිරීමේ ගාස්තු රු. 1,680,000 ක් හා තානායම් කුලී රු. 6,914,015 ක් දීර්ඝ කාලයක සිට සභාවට අයවිය යුතුව තිබූ නමුත්, එම ආදායම් ලබා ගැනීමට හෝ ගිවිසුම් ප්‍රකාරව නීතී ක්‍රියාමාර්ග ගැනීමට හෝ මේ දක්වා කටයුතු කර නොතිබුණි.

2.3.5 උසාවි දඩ

------------

2014 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා ලැබිය යුතු උසාවි දඩ මුදල් ප්‍රමාණය හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 අක්‍රිය ගිණුම්.

----------------

අක්‍රීයව පවතින සැලසුම් කමිටු බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට රු. 1,415,167 ක ශේෂයක් පැවතින.

3.2 දෘශ්‍ය වංචනික ගනුදෙනු

--------------------------

සභාවේ නිලධාරීන් විසින් ලදුපත් වෙනස්කිරීම, අස්ථානගත කිරීම, උපලේඛණ වෙනස් කිරීම ආදී ක්‍රම මගින් දුෂ්සන්ධානයෙන් යුතුව කටයුතු කිරීම නිසා රු. 2,657,041 ක මූල්‍ය අක්‍රමිකතාවයක් සිදුව ඇති බව නාගරික කොමසාරිස්වරයාගේ 2015 ජූනි 23 දිනැති වාර්තාවෙන් අනාවරණය කර තිබුණි.

ලදුපොතක සියළු ලදුපත් නිකුත් කිරීමෙන් පසුව ඊලඟට අළුතින් ලදුපොතක් නිකුත් කිරීමට කටයුතු කල යුතු වුවද, යථෝක්ත නිලධාරීන්ට නිකුත් කර තිබූ ලදුපොත් 35 ක් නැවත ආයතනය වෙත භාරදී නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(අ) <u>සළුපිලිසල ගොඩනැගිල්ල සහිත ඉඩම</u>

1929 වර්ෂයේ පිළිගත් මිනින්දෝරුවෙකු විසින් මැනුම් කරන ලද ඉඩම් පිළිබඳ විස්තර වාර්තාව (Tenement List) අනුව සළුපිලිසල ගොඩනැගිල්ල සහිත ඉඩම පර්චස් 23.5 ක් පමණක් වන නමුත්, 1969 අගෝස්තු 23 දින අංක 38286 දරන බදුකරය මගින් පර්චස් 35 ක් ලෙස සඳහන් කර යථෝක්ත ඉඩම සමුපකාර පේෂකාර්මික සමිති සංගමයකට බදු දී පසුව 2008 මහ සභා තීරණයක් අනුව 2009 දෙසැම්බර් 08 දින නැවත සභාවට පවරා ගැනීමට තීරණය කර තිබුණි.

දෙමහල් ගොඩනැගිල්ල එදිනට ස්ථානීය වටිනාකම රු. 1,530,000 ක් ලෙස තක්සේරු කර ඉන් රු. 765,000 ක් පළමුව ගෙවීම් සිදුකර තිබුණි. නමුත් බදු දී තිබූ සම්පූර්ණ ඉඩම වෙනුවට නගර සභාවට භාරදෙන ලද ගොඩනැගිල්ල සහිත භූමි ප්‍රමාණය පර්චස් 4.95 ක් බව බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් 2012 සැප්තැම්බර් 23 දින වාර්තා කර තිබූ නමුත්, ඉතිරි ඉඩම් කොටස සභාව වෙත ලබා ගැනීම සඳහා කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) <u>සළුපිලිසල ගොඩනැගිල්ල හා ඉඩම බදු දීම.</u>

2013 සැප්තැම්බර් 05 දිනැති රු. 10,000,000 ක තක්සේරුව මත පදනම්ව අවස්ථා 02 කදී රු. 169,008 ක වියදමින් පුවත්පත් දැන්වීම් 02 ක් ප්‍රසිද්ධ කර ඉහත බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබුණි.

i. එක් ටෙන්ඩර්කරුවෙකු විසින් රු. 10,002,000 ක වටිනාකමින් යුතු ටෙන්ඩර් අයදුම්පතක් නගර සභා සේවකයින් දෙදෙනෙකුගේ සාක්ෂි අත්සන් සහිතව ඉදිරිපත් කර තිබූ නමුත් ටෙන්ඩර් මණ්ඩල සාමාජිකයින්ගේ අත්සන් රහිත ටෙන්ඩර් මණ්ඩල තීරණයක් මගින් එම ටෙන්ඩර්කරුට යථෝක්ත ගොඩනැගිල්ල බදු දී තිබුණි.

ii. ගිවිසුමේ කොන්දේසි අනුව පැවති ගොඩනැගිල්ල නවීකරණය කර පවත්වාගෙන යායුතු වුවත්, එම කොන්දේසි කඩකරමින් පැවති ගොඩනැගිල්ල 2014 මැයි 13 දින කඩා ඉවත් කර එම ස්ථානයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කර තිබූ නමුත් ඒ සඳහා ඉදිරිපත් කරන ලද ගොඩනැගිලි සැලැස්මට, සැලසුම් අනුමත කිරීමේ විධිමත් ක්‍රමවේදයෙන් බැහැරව අනුමැතිය ලබා දී තිබුණි.

iii. වීථි රේඛා සීමා නොසලකමින් ඉහත භූමියේ ගොඩනැගිල්ල ඉදිකිරීමට අත්තිවාරම් යොදා බිම් මහලේ ඉදිකිරීම් කටයුතු සිදු කරමින් තිබූ බව 2015 ජනවාරි 13 දින සිදුකල ස්ථානීය පරික්ෂාවේදි අනාවරණය විය.

iv. ඉහත ගොඩනැගිල්ල සහ ඉඩම 2014 මැයි 13 දින බදු ලබා දීමෙන් පසු එම ස්ථානයේ පවතින අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා නියෝග කර තිබුණද, එම නියෝග ක්‍රියාත්මක කර නොතිබූ බවත්, එකී අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් සභාව මඟින් විධිමත් සොයා බැලීමක් සිදු නොකිරීම හේතුවෙන් රු. 30,000 ක නෛතික වියදමක් සභාවට දැරීමට සිදු වී තිබූ බවත් නිරීක්ෂණය විය.

(ඇ) <u>නීතිඥ ගාස්තු</u>

සභාවේ සියළුම නීති කටයුතු සහ අධිකරණ කටයුතු කරගෙන යාම සඳහා නීතිඥවරයෙකුට රු. 12,000 ක මාසික ගාස්තුවක් ගෙවීමටත්, අධිකරණයේ පෙනී සිටීම වෙනුවෙන් දිනකට රු. 300 ක් ගෙවීමටත් තීරණය කර නීතිඥවරියකුගේ සේවය ලබා ගෙන තිබුණි.

නීතිඥවරියට නීති කටයුතු සඳහා ගිවිසුම් ප්‍රකාරව මාසික දීමනාවක් ගෙවා තිබියදි ඇයට නඩු කටයුතු සඳහා පෙනී සිටීම වෙනුවෙන් අවස්ථා 02 කදී රු. 35,000 බැගින් රු. 70,000 ක්ද, ගෙවා තිබුණි. පළාත් පාලනදෙපාර්තමේන්තුව මඟින් බදු ගිවිසුම් සඳහා නිශ්චිත ආකෘතියක් හඳුන්වා දී තිබියදී නීතිඥවරිය විසින් පිළියෙල කරන ලද බදු ගිවිසුම් සඳහා සේවා ගාස්තු ලෙස රු. 614,115 ක්ද, ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------

4.1 අයවැය පාලනය
------------------

වැය විෂයයන් 36 කට අදාලව රු. 84,888,320 ක මුළු ප්‍රතිපාදන කිසිදු කාර්යයක නොයොදා තිබුණි.

4.2 පිළිතුරු නොලත් විගණන විමසුම්
-------------------------------------

2014 දෙසැම්බර් 31 දින වනවිට ගණනය කල හැකි වටිනාකම වූ රු. 343,641,728 ක් වූ විගණන විමසුම් 34 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් උපයෝජනය